


**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

(01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් මූල්‍ය කළමණාකරණය/ගණකාධිකරණය/ ව්‍යාපාර පරිපාලනය/ වාණිජ හෝ ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ මූලික උපාධියක්.

සමග

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද

(02) තනතුරට අදාළ විෂය ක්ෂත්‍රයේ පිළිගත් වෘත්තීමය වරලත් ආයතනයක අන්තර් මධ්‍යම සහතික පත්‍ර පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

සමග

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

(01) ඉහත දැක්වෙන බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(02) තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ සහකාර කළමනාකරණ **(JM)** මට්ටමේ තනතුරක වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.)

**වැටුප් හා අනෙකුත් දීමනා : MM 1-1 Rs. [53,175 – 10 x 1375 – 15 x 1,910 – 95,575]**
මූලික වැටුප : රු. 53,175/- (මීට අමතරව තනතුරට අදාලව රජය විසින් අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.)
ප්‍රවාහන දීමනාව රු.12,500/- + ජංගම දුරකථන ප්‍රතිපූර්ණය රු.3,000/- (මාසික)
මෙම තනතුර සඳහා හිමිය

**සුදුසු අයදුම්කරු සතුව,**

- විශිෂ්ඨ විශ්ලේෂණ, ගැටළු නිරාකරණ සහ සංවිධානාත්ම හැකියාවන් සමග ඇගයුම් විචාරණ, දත්ත අර්ථකථන නිපුණතාවය සහ උසස් ලෙස ස්වයං අභිප්‍රේරිත පුද්ගලයෙක් විය යුතුය;
- ඉහළ නායකත්ව ගුණාංග, අන්තර් පුද්ගල සන්නිවේදන හැකියාවන්ගෙන් යුක්ත විය යුතුය.
- ප්‍රශස්ත මට්ටමේ තොරතුරු තාක්ෂණ හැකියාවෙන් යුක්ත විය යුතුය.
- බහුවිධ කණ්ඩායම් වලට නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ සනාථ කල හැකියාව තිබිය යුතුය. මානව සහ අනෙකුත් සම්පත් නිසිලෙස යෙදවීමේ සහ සාර්ථකව කළමනාකරණය කිරීමේ පළපුරුද්ද තිබිය යුතුය.

**අනෙකුත් :**

**සෑම අයදුම්කරුවෙකුම,**

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

II. තනතුරේ කාර්යභාරය හොඳින් ඉටුකිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවය තිබිය යුතුය.

III. විශිෂ්ඨ පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය.

ඔබ සතුව මෙම සුදුසුකම් සහ පළපුරුද්ද ඇත්නම්, මෙම දැන්වීම පළවී දින 14ක් ඇතුළත ඔබගේ ජීව දත්ත පිටපත, සහතික පත්‍රවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න. (අයදුම්කරන ලද තනතුර ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර තිබිය යුතුය.)

(කෙටි ලැයිස්තුගත කළ අපේක්ෂකයන්ට පමණක් ආයතනය විසින් ප්‍රතිචාර දක්වනු ලැබේ.)

වෙළඳ අමාත්‍යාංශය

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්,
සතොස මූලස්ථාන ගොඩනැගිල්ල,
අංක 27, 05 වන මහල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

ලංකා සතොස